# පළාත් සභා නිවේදන

මගේ අංකය : මපස/ඊ/15/93.

## මධ්‍යම පළාත් සභාව

මතු දැක්වෙන ප්‍රඥප්තිය 1994.04.20 වැනි දින පැවැති මධ්‍යම පළාත් සභාවේ සභා රැස්වීමේදී ඒකමතිකව සභා සම්මත වූ අතර, මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අංක ජීසීපී/එල්ඒ/3 හා 1994.05.02 වැනි දින දරන ලිපියෙන් එයට අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

පී. ආර්. රණසිංහ,
සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව.

1994 ජුනි මස 13 වැනි දින,
මධ්‍යම පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 98,
පල්ලේකැලේ,
කුණ්ඩසාලේ.

## 1993 අංක 05 දරන මධ්‍යම පළාතේ නිවාස සංවර්ධන ප්‍රඥප්තිය

*මධ්‍යම පළාත තුළ නිවාස සමිති සංස්ථාපනය කිරීම සඳහා ද, නිවාස සංවර්ධන අරමුණු ප්‍රගුණ කිරීම සඳහා ද, එවැනි අරමුණු සඳහා ණය මුදල් ලබාදීම සහ වෙනත් පහසුකම් සලසා දීම සඳහා ද සහ ඊට සම්බන්ධ වූ කරුණු හෝ ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස සකවනු ලබන ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය ජාතික නිවාස පනතට අනනුකූල වේ.*

ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් පහත දැක්වෙන පරිදි පනවනු ලැබේ.

ලුහුඬු නාමය.

(1) මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාත් සභාවේ 1993 වර්ෂයේ අංක 05 දරන නිවාස සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබෙන දින සිට මෙම ප්‍රඥප්තිය වලංගු වේ.

නිවාස සංවර්ධන අරමුණු.

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා මෙහි පහත සඳහන් කරුණු පළාත තුළ බලපවත්නා වූ නිවාස සංවර්ධන අරමුණු බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:—

(අ) පදිංචිය සඳහා නිවාස ගොඩනැගිලි ඉදිකිරීම ;

(ආ) එවැනි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ;

(ඇ) වෙනත් ව්‍යවස්ථාපිත නීතිවලට යටත්ව ප්‍රවේශ මාර්ග, ජල සේවාවන්, විදුලි සේවාවන්, ගෑස් සහ ජල ප්‍රවාහන ක්‍රම එවැනි ගොඩනැගිලිවලට සහ ගොඩනැගිලි ව්‍යාපෘති වලට සැපයීම ;

(ඈ) එවැනි ගොඩනැගිලි හෝ ගොඩනැගිලි ව්‍යාපෘති පරිපාලනය, කළමනාකරණය හෝ පාලනය කිරීම ;

(ඉ) දැනටමත් ආරම්භ කර ඇති යම්කිසි නිවාස යෝජනා ක්‍රමයක වුව ද වෙසෙන පදිංචිකරුවන් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම ;

(ඊ) වෙනත් ව්‍යවස්ථාපිත නීති වලට යටත්ව ඉඩම් සංවර්ධන කිරීම සහ ඒවා ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීම ;

(උ) පදිංචිය සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේ යෙදෙන අයවලුන්ට සහනාධාර හෝ ණය පහසුකම් සැපයීම.

නිවාස සංවර්ධන බලතල.

(3) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා මෙහි පහත විස්තර වශයෙන් දක්වා ඇති එක් එක් බලතල නිවාස සංවර්ධන බලතල බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ :—

(අ) වංචල හෝ නිශ්චල දේපළ තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයට භාර ගැනීම, ඒවා තබා ගැනීම, පාලනය කිරීම, විකිණීම, බදු දීම, උකස් තැබීම, හුවමාරු කිරීම හෝ එසේ නැතිනම් නිවාස සංවර්ධන අරමුණක් ඉටු කර ගැනීම සඳහා එවැනි දේපළ වෙනත් ආකාරයට බැහැර කිරීම සඳහා වූ බලය ;

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ කිසියම් නිවාස සංවර්ධන අරමුණක් ඉටු කර ගැනීම සඳහා දේශීය වශයෙන් අරමුදල් සපයන මාර්ග වලින් මුදල් ණයට ලබාගැනීමේ බලය ;

(ඇ) මෙම ප්‍රඥප්තිය යටතේ කිසියම් නිවාස සංවර්ධන අරමුණක් ඉටු කිරීමෙන් පසු ලබාදෙන ලද කිසියම් ගොඩනැගිල්ලක් හෝ සේවාවක් සඳහා ගෙවල් කුලිය හෝ ගාස්තු අයකිරීමේ සහ භාර ගැනීමේ බලය ;

(ඈ) වෙනත් ව්‍යවස්ථාපිත නීතිවලට යටත්ව මෙම ප්‍රඥප්තිය යටතේ කිසියම් නිවාස සංවර්ධන අරමුණක් ඉටුකර ගැනීමේ කාර්යය සඳහා කිසියම් කොන්ත්‍රාත්තුවකට බැඳීමට හෝ කිසියම් වැඩක් ඉටුකිරීම හෝ කිසියම් දෙයක් සෙලින්ම හෝ නිසි අයුරු පත්කරනු ලැබුවා වූ නියෝජිතයන් ලවා කරවා ගැනීමට ඇත්තා වූ බලය.

**පළාත් නිවාස සංවර්ධන ගිණුම.**

4\. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පළාත් සභා අරමුදලේ "මධ්‍යම පළාත් නිවාස සංවර්ධන ගිණුම" (මින් ඉදිරියට නිවාස සංවර්ධන ගිණුම වශයෙන් හඳුන්වන ලබන) යනුවෙන් වෙනම ගිණුමක් පවත්වාගෙන යා යුතුය.

(2) නිවාස සංවර්ධන අරමුදලට ලැබෙන පහත විස්තර සඳහන් ලැබීම් පළමුවෙන් පළාත් සභා අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර, ඉන් පසුව ඒවා නිවාස සංවර්ධන ගිණුමට මාරු කළ යුතුය :–

(අ) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පළාත් සභාව විසින් දෙනු ලබන ආධාර මුදල් හා අත්තිකාරම් මුදල් ;

(ආ) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා දානපති පුද්ගලයින්ගෙන් හා රාජ්‍ය නොවන සංවිධාන වලින් ත්‍යාග වශයෙන් ලැබෙන මුදල් ;

(ඇ) මෙම ප්‍රඥප්තිය යටතේ වංචල හෝ නිශ්චල දේපළ අලෙවියෙන්, බදුදීමෙන්, හෝ උකස් තැබීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ ගොඩනැගිලි කුළී වශයෙන් ද එකතු වන්නා වූ සියළුම මුදල්.

(3) මෙම ප්‍රඥප්තීන් සලසා ඇති විධිවිධාන වලට යටත්ව නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස් විසින් නිවාස සංවර්ධන ගිණුම පවත්වා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

(4) නිවාස සංවර්ධන ගිණුම පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III වැනි පරිච්ඡේදයේ පළාත් සභා අරමුදලට අදාළ විධිවිධාන වලට යටත් විය යුතුය.

**නිවාස සංවර්ධන අරමුදලින් ගෙවීම.**

5\. නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයා විසින් –

(අ) මෙම ප්‍රඥප්තිය යටතේ නිවාස සංවර්ධන අරමුණක් සඳහා ණය ආධාරයක් ලබාදීමට ;

(ආ) නිවාස සංවර්ධන අරමුදලින් අයවිය යුතු යැයි එම ප්‍රඥප්තිය යටතේ ප්‍රකාශිත ගෙවීමක් සිදු කිරීමට ;

(ඇ) මෙම ප්‍රඥප්තිය යටතේ කිසියම් නිවාස සංවර්ධන අරමුණක් සඳහා ඇමතිවරයා විසින් බලය දෙන ලද වෙනත් එවැනි වියදම් දැරීමට කිසියම් මුදලක් අවශ්‍ය යැයි අදහස් කරන විට එවැනි සියලුම මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශය මත, එම කාර්යය සඳහා නිවාස සංවර්ධන අරමුදලෙන් ගෙවිය යුතු වන්නේ ය.

**නිවාස සංවර්ධන අරමුදලේ ලින් වර්ෂය.**

6\. ලින් වර්ෂය නිවාස සංවර්ධන අරමුදලේ කාර්යයන් සඳහා මුදල් වර්ෂය වන්නේ ය.

**නිවාස සංවර්ධන අරමුදල විගණනය.**

7\. (1) මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ගෙවී යාමට මත්තෙන් නිවාස සංවර්ධන අරමුදලේ වත්කම් හා බැරකම් පිළිබඳ විස්තර එක් එක් මුදල් වර්ෂය සඳහා වෙන වෙනම විගණනය කිරීම සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) නිවාස සංවර්ධන අරමුදලට අදාළ විගණනය කිරීම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වන වගන්තියේ සලසා ඇති විධිවිධාන වලට අනුකූල විය යුතුය.

**පළාත් නිවාස කොමසාරිස් පත් කිරීම ආදිය.**

8\. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා නාමිකව හෝ නිල වශයෙන් කටයුතු කළ හැකි පුද්ගලයකු නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයා වශයෙන් පත් කළ යුතු වන්නේ ය. එම තැනැත්තා මෙම ප්‍රඥප්තියේ සලසා ඇති විධිවිධාන සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම සඳහා ක්‍රියා කරනු ලැබිය යුතුය.

(2) නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ වූ සිය බලතල, කාර්යයන් හා යුතුකම් ඉටු කිරීමේ දී, සිදු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී ඇමැතිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන වලට යටත් වන්නේ ය.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයාට සිය බලතල, කාර්යයන් හා යුතුකම් ඉටුකිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා සහය වීමට අවශ්‍ය වන්නා වූ වෙනත් නිලධාරීන් හා සේවකයින් සංඛ්‍යාවක් පත්කර ගනු ලැබිය හැකිය.

(4) මෙම ප්‍රඥප්තිය යටතේ වෙනත් නිලධාරීන්ට හා සේවකයින්ට පවරනු ලැබුවා වූ හෝ නියම කරනු ලැබුවා වූ බලතල, කාර්යයන් හෝ යුතුකම් ඉටු කිරීමේ දී, ක්‍රියාත්මක කිරීමේ දී හෝ සිදුකිරීමේ දී ඔවුන් නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන වලට යටත් වන්නේ ය.

**නිවාස සංවර්ධන සමිතිය.**

9\. (1) 02 වැනි වගන්තිය යටතේ සඳහන් කර ඇත්තා වූ කිසියම් නිවාස සංවර්ධන අරමුණක් ඉටු කර ගැනීමේ කාර්යයට සහාය වීම සඳහා හෝ පහසු කිරීම සඳහා පළාත තුළ නිවාස සංවර්ධන සමිති පිහිටවනු ලැබිය හැකිය.

(2) නිවාස සංවර්ධන සමිතියක සංයුතිය සාමාජිකයන්ගේ අයිතිවාසිකම් හා යුතුකම්, සමිති නිලධාරීන්ගේ කාර්යයන් හා යුතුකම් නියම කරනු ලැබිය හැකිය.

(3) දෙවන වගන්තිය යටතේ සඳහන් කර ඇත්තා වූ යම්කිසි නිවාස සංවර්ධන අරමුණක් ඉටුකර ගැනීමේ කාර්යය සඳහා නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්ට මෙහි 1 වැනි උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබිය හැකි නිවාස සංවර්ධන සමිතියක සහභාගීත්වය අයද සිටිනු ලැබිය හැකිය.

නිවාස සංවර්ධන සමිති වල සාමාජිකයන්ට ආධාර.

10. (1) පහත දක්වා ඇති විධිවිධාන වලට යටත්ව නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයාට යම්කිසි නිවාස සංවර්ධන සමිතියක සාමාජිකයකුට හෝ වෙනත් අන්‍ය තැනැත්තකුට ආධාර වශයෙන් ඉඩම් කොටසක්, ණය ආධාරයක් හෝ වෙනත් මූලික පහසුකමක් එසේ එවැනි ආධාරයක් එම තැනැත්තාට උවමනා වී ඇතිනම් ලබාදිය හැකිය.

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා මෙම වගන්තියේ 01 වැනි උපවගන්තිය යටතේ වූ නිවාස සංවර්ධන අරමුණක් සඳහා, නිවාස සංවර්ධන සමිතියට කිසියම් සාමාජිකයකුට හෝ වෙනත් අන්‍ය තැනැත්තකුට (මින් ඉදිරියට කට්ටිකරු යැයි හඳුන්වනු ලබන්නා වූ) නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළ එම නිවාස සංවර්ධන අරමුණ සම්පූර්ණ කිරීමේ කොන්දේසියට හා වෙනත් ගිවිසුම් හා කොන්දේසි වලට යටත්ව, ඇමතිවරයාගේ අනුමැතිය ඇතිව ඉඩම් කැබැල්ලක් ලබා දී ඇති විට, එම කට්ටිකරු යථෝක්ත නිවාස සංවර්ධන අරමුණ නියම කර ඇති කාල පරිච්ඡේදයක් තුළ හෝ ඇමතිවරයාගේ ද අනුමැතිය ඇතිව නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයා විසින් තවදුරටත් අවසර දෙනු ලබන කාල පරිච්ඡේදයක් තුළ, එකී කොමසාරිස්වරයා සෑහීමට පත්වන අයුරින් සම්පූර්ණ කිරීමට බැඳී සිටින අතර, නියම කරනු ලබන වෙනත් ගිවිසුම් හා කොන්දේසි ද පිළිපැදිය යුතුය.

(3) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා මෙම වගන්තියේ 01 වැනි උපවගන්තිය යටතේ වූ නිවාස සංවර්ධන අරමුණ සඳහා නිවාස සංවර්ධන සමිතියක සාමාජිකයකුට හෝ අන්‍ය තැනැත්තකුට (මින් ඉදිරියට ණයගැතියා යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ) එකී නිවාස සංවර්ධන අරමුණ සම්පූර්ණ කර නියම කරනු ලබන්නා වූ කාල පරිච්ඡේදයක් තුළ ආපසු ගෙවා අවසන් කළ යුතුය, යන කොන්දේසියට හා වෙනත් ගිවිසුම් හා කොන්දේසි වලට යටත්ව නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස් විසින් ණය මුදලක් ලබා දී ඇති විට, ණය ගැතියා විසින් එකී කොමසාරිස්වරයා සෑහීමට පත්වන ආකාරයට එකී නිවාස සංවර්ධන අරමුණු සම්පූර්ණ කිරීමට බැඳී සිටින අතර, නියම කර ඇති කාලපරිච්ඡේද තුළ හෝ ඇමතිවරයාගේ අනුමැතිය ඇතිව එකී නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයා විසින් තවදුරටත් අවසර දෙනු ලබන කාල පරිච්ඡේදයක් තුළ, මෙම ණය මුදල සහ ඊට වැටගෙන පොලිය සහ වෙනත් පරිපාලනමය ගාස්තු වශයෙන් වූ අයකිරීම් ද සමග ආපසු ගෙවිය යුතු අතර, නියම කරනු ලබන වෙනත් ගිවිසුම් හා කොන්දේසි ද පිළිපැදිය යුතුය.

(4) මෙම වගන්තියේ 01 වැනි උපවගන්තිය යටතේ නිවාස සංවර්ධන සමිතියක යම් කිසි සාමාජිකයකුට හෝ, වෙනත් අන්‍ය තැනැත්තකුට කිසියම් පහසුකමක් සපයා දීමේ දී නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයාට කිසියම් වියදමක් දැරීමට සිදු වූ විට, එසේ දැරීමට සිදු වූ වියදම සහ ඊට වැටගෙන පොලියක් සමග එකී කොමසාරිස්වරයා විසින් ඒ පිළිබඳ විධානය කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළ, විය යුතු ආකාරයට එකී සාමාජිකයා විසින් හෝ තැනැත්තා විසින් ගෙවීමට බැඳී සිටිනු ලැබේ.

නිවාස ණය සඳහා පොලිය.

11. මෙම ප්‍රඥප්තිය යටතේ ලබා දෙන්නා වූ නිවාස ණය සඳහා සහ නිවාස සංවර්ධන ගිණුමෙන් දෙනු ලබන්නා වූ අත්තිකාරම් මුදල් සඳහා ද නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයාට දැරීමට සිදු වන්නා වූ වියදම් සඳහා ද, මෙම ප්‍රඥප්තිය යටතේ පරිපාලන ගාස්තු වශයෙන් අයකරනු ලබන අය කිරීම් සඳහා ද අය කළ යුතු පොළී අනුපාතය නියම කරනු ලැබේ.

මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය ඉඩම්.

(12) (1) මෙම ප්‍රඥප්තිය යටතේ නිවාස සංවර්ධන අරමුණක් සඳහා පළාත තුළ පිහිටි යම්කිසි ඉඩමක් අවශ්‍ය යයි ඇමතිවරයා අදහස් කරන විට, ඇමතිවරයාගේ නිර්දේශය මත පළාත් සභා රැස්වීමකදී සම්මත කරගනු ලබන්නා වූ යෝජනාවක් මගින් .–

(අ) එම ඉඩම රජය සතු ඉඩමක් නම් ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වෙනි උපලේඛනයේ 01 වැනි ලැයිස්තුවේ II වැනි ඇමුණුමේ 1 : 2 කාරණය ප්‍රකාර යථෝක්ත අරමුණ සඳහා එම ඉඩම පළාත් සභාවට ලබාදෙන ලෙස ජනරජයේ ජනාධිපතිතුමාගෙන් ; හා

(ආ) පුද්ගලික ඉඩමක් නම් යථෝක්ත අරමුණ සඳහා එම ඉඩම, ඉඩම් අත්පත් කරගැනීමේ ආඥාපනත යටතේ පළාත් සභාව වෙනුවෙන් අත්පත් කර ගෙන පළාත් සභාවට ලබා දෙන ලෙස අමාත්‍ය මණ්ඩලයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කළ යුතුය.

(2) 01 වැනි උපවගන්තිය යටතේ එවැනි යෝජනාවක් පළාත් සභාවේදී සභා සම්මත කර ගත් විට එම යෝජනාව :—

(අ) රජය සතු ඉඩමක් සම්බන්ධයෙන් නම්, ජනරජයේ ජනාධිපතිතුමා වෙත ද ;

(ආ) පුද්ගලික ඉඩමක් සම්බන්ධයෙන් නම්, ජනරජයේ අමාත්‍ය මණ්ඩලයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයා වෙත ද ;

ඒ සඳහා නියම කරනු ලබන්නා වූ ආකෘති පත්‍රය මගින් එකී ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

(3) 02 වැනි උපවගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රය මත ජනරජයේ ජනාධිපතිතුමා හෝ, ජනරජයේ අමාත්‍ය මණ්ඩලයේ ඉඩම් විෂය භාර ඇමතිවරයා හෝ, විය යුතු ආකාරයට, එසේ ඉල්ලුම් කරන ලද ඉඩම පළාත් සභාවට ලබා දෙනු ලැබුව හොත්, ජනරජයේ ජනාධිපතිතුමා විසින් හෝ ජනරජයේ අමාත්‍ය මණ්ඩලයේ ඉඩම් විෂය භාර ඇමතිවරයා විසින් හෝ, විය යුතු ආකාරයට, එකී ඉඩම පළාත් සභාවට ලබාදෙන විට නියමකරනු ලබන්නා වූ, වන්දි මුදල් ගෙවීම් ඇතුළුව වෙනත් ගිවිසුම් හා කොන්දේසිවලට යටත්ව, එකී ඉඩම වෙන කිසිම අරමුණකට නොයොදවා, එසේ ඉල්ලුම් කරනු ලැබුවා වූ අරමුණ සඳහාම පමණක් පළාත් සභාව විසින් යොදවා ගත යුතුය.

නිවාස අරමුණ සම්පූර්ණ නොකළ විට ගන්නා ක්‍රියා මාර්ගය.

13. (1) කිසියම් කට්ටිකරුවෙකුට නිවාස සංවර්ධන අරමුණක් සඳහා වෙන් කර දෙනු ලැබූ ඉඩමක එකී නිවාස සංවර්ධන අරමුණ සම්පූර්ණ කිරීමට අපොහොසත් වී ඇති බව හෝ, එසේ එකී ඉඩම වෙන්කර දීමට යටත් වූ ගිවිසුම් හා කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වී ඇති බව හෝ, නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයාගේ අදහස වන්නේ නම් එකී ඉඩමේ සිය භුක්තිය එකී කොමසාරිස්වරයාට භාර දෙන ලෙස ලිඛිත දැන්වීමක් මගින් ඉල්ලා සිටිය යුතු අතර, පළාත් සභාවට එකී ඉඩම නිසා දැරීමට සිදු වූ යම්කිසි වියදම් ද පළාත් සභාවට අයවීමට ඇති වෙනත් මුදල් ද, එකී දැන්වීමේ නියම කරනු ලබන කාල සීමාව තුළ එකී කොමසාරිස්ට ගෙවිය යුතුය.

(2) 01 වැනි උපවගන්තිය යටතේ වූ දැන්වීමේ නියමිත කර ඇති කාලය තුළ එකී ඉඩමේ සිය භුක්තිය භාර දීමට එකී කට්ටිකරු අපොහොසත් වුවහොත් හෝ, පැහැර හැරිය හොත් හෝ ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව, නිවාස කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා විසින් ජනරජයේ ජනාධිපති තුමාගෙන් හෝ ජනරජයේ අමාත්‍ය මණ්ඩලයේ ඉඩම් විෂය භාර ඇමතිවරයාගෙන් හෝ විය යුතු ආකාරයට එකී ඉඩමේ භුක්තිය ආපසු භාර ගෙන පළාත් සභාවට නැවත ලබා දෙන ලෙස ඉල්ලා සිටිනු ඇත.

(3) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා 02 වෙනි උපවගන්තිය යටතේ නැවත පළාත් සභාවට භාර ගන්නා ලද්දා වූ කිසියම් ඉඩමක් ඇමතිවරයාගේ අභිමතය පරිදි නිවාස සමිතියක සම්සිසි සාමාජිකයකුට හෝ වෙනත් අන්‍ය තැනැත්තකුට නිවාස සංවර්ධන අරමුණක් සඳහා නැවත වෙන් කර දෙනු ලැබිය හැකිය.

**රජයේ ඉඩම් අපහරණය.**

14. මෙම ප්‍රඥප්තිය යටතේ කට්ටිකරුවකු වෙත වෙන්කර දුන් රජය සතු ඉඩමක, එකී කට්ටිකරු විසින් නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස් සැහීමට පත්වන අයුරු එකී නිවාස සංවර්ධන අරමුණ සම්පූර්ණ කර ඇති විට, එකී පළාත් කොමසාරිස් විසින් ඇමතිවරයාගේ එකඟත්වය ද ඇතිව, රජයේ ඉඩම් ආඥාපනතේ 6(1) වගන්තිය යටතේ එම ඉඩමට නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස් වෙත විශේෂ දීමනා පත්‍රයක් නිකුත් කරන ලෙස ඉඩම් කොමසාරිස්වරයා වෙත නිර්දේශයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

**ඉඩම් මිල ගෙවීම.**

15. (1) ප්‍රධාන තක්සේරුකරු විසින් ඉඩමක් සඳහා තක්සේරු කරන ලද මිලෙන් 25%කට සමාන මුදලක් පළාත් සභාවේ තැන්පත් නොකරන්නා වූ නිවාස සංවර්ධන සමිතියක කිසිම සාමාජිකයකුට හෝ, වෙනත් අන්‍ය කිසිම තැනැත්තකුට හෝ, එවැනි ඉඩමක් වෙන්කර නොදිය යුතුය.

(2) 01 වැනි උපවගන්තිය යටතේ තක්සේරු කරන ලද ඉඩමේ මිලෙන් ඉතිරි මුදල් ප්‍රමාණය නියම කරනු ලබන ගිවිසුම් හා කොන්දේසි යටතේ, එකී සාමාජිකයා විසින් හෝ, එකී වෙනත් අන්‍ය තැනැත්තා විසින් හෝ, එසේ නියම කරනු ලැබූ කාල පරිච්ඡේදය තුළ හා, නියම කරනු ලැබූ වාරික ගණනින් ආපසු ගෙවනු ලැබිය යුතුය.

**ගෙවීම් පැහැර හළ විට කටයුතු කිරීම.**

16. කිසියම් කට්ටිකරුවකු එවැනි ඉඩමක වටිනාකම ගෙවීමේ දී වාරිකය හෝ පොලිය වශයෙන් හෝ, නැතහොත් එම දෙකම වශයෙන් අයවිය යුතු කිසියම් වාරික මුදලක් ගෙවීම පැහැර හළ විට පැහැර හැරිය විට එම ගෙවීම් කිරීම පැහැර හැර ඇත්තේ එකී ඉඩමේ වටිනාකමේ නොගෙවූ මුළු මුදල් කොටස් ප්‍රමාණය සඳහා ඊට වැටෙන ඒ කාලය දක්වා වූ මුළු පොලී මුදල් ප්‍රමාණයටම බව සැලකිය යුතු අතර, නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස් විසින් ඇමතිවරයාගේ උපදෙස් ද ඇතිව, ඒ පිළිබඳ 18 වැනි වගන්තියේ සඳහන් වූ ප්‍රකාර නිසි අයුරු ක්‍රියා කළ යුතුය.

**10 වැනි වගන්තිය යටතේ ණය මුදලක් ගෙවීම පැහැර හැරීම.**

17. යම්කිසි ණයගැතියකු 10 වැනි වගන්තිය යටතේ ලබා දෙනු ලැබූවා වූ ණය මුදලක් සඳහා වාරිකය වශයෙන් හෝ පොලිය වශයෙන් හෝ නැතහොත් එම දෙකම වශයෙන් අයවිය යුතු කිසියම් වාරික මුදලක් ගෙවීම පැහැර හළ විට, පැහැර හැරිය විට, එම ගෙවීම් කිරීම පැහැර හැර ඇත්තේ එකී ණය මුදල් නොගෙවූ මුළු මුදල් කොටස් ප්‍රමාණය සඳහා සහ ඊට වැටෙන, ඒ කාලය දක්වා වූ මුළු පොලී මුදල් ප්‍රමාණයට බව සැලකිය යුතු අතර නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස් විසින් ඇමතිවරයාගේ උපදෙස් ද ඇතිව, ඒ පිළිබඳව 18 වැනි වගන්තියේ සඳහන් ප්‍රකාර නිසි අයුරු ක්‍රියා කළ යුතුය.

**ඉතිරි වටිනාකම හෝ ණය අයකර ගැනීමේ ක්‍රියා මාර්ගය.**

18. 16 වැනි වගන්තිය යටතේ ඉඩමට ගෙවන්නට තිබෙන වටිනාකමින් නොගෙවූ මුළු මුදල් කොටස සහ ඊට වැටෙන පොලී මුදල් ප්‍රමාණය ද ගෙවීම පැහැර හැර ඇති බව විනිශ්චය කළ විට හෝ, 10 වැනි වගන්තිය යටතේ ලබා දුන්නා වූ ණය මුදලින් නොගෙවූ මුළු මුදල් කොටස් සහ ඊට වැටෙන පොලිය ද ගෙවීම පැහැර හැර ඇති බව විනිශ්චය කළ විට හෝ නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයා දීමනාකරුට එසේ වෙන්කර දෙන ලද්දා වූ එකී ඉඩම පිහිටා තිබෙන හෝ, ණය ගැතියා පදිංචි වී සිටින විය යුතු ආකාරයට, අධිකරණ බලප්‍රදේශය තුළ පිහිටුවා ඇති දිස්ත්‍රික් උසාවියේ එකී ඉඩමේ වටිනාකමින් නොගෙවූ මුළු මුදල් කොටස සහ ඊට වැටෙන පොලී මුදල් ප්‍රමාණය ද අයකර ගැනීමට හෝ, ලබා දුන්නා වූ ණය මුදලින් නොගෙවූ ණය මුදල් කොටස සහ ඊට වැටෙන පොලී මුදල් ප්‍රමාණය හෝ අයකර ගැනීම සඳහා, නීති කෘත්‍යයක් ආරම්භ කිරීම නීත්‍යානුකූල වන්නේය.

**වෙනත් ගාස්තු අයකර ගැනීම.**

19. (1) මෙම ප්‍රඥප්තිය යටතේ නිවාස කටයුතු පිළිබඳ පළාත් කොමසාරිස්වරයා විසින් දරා ඇති කිසියම් වියදමක් හෝ පරිපාලන ගාස්තුවක් අයකර ගැනීමට ඇති විට, එකී කොමසාරිස්වරයා නීති ප්‍රකාර ඉල්ලීමක් මගින් එකී වියදම් හෝ අයවිය යුතු ගාස්තු ඒ සඳහා එකතු වූ පොලියත් සමග එකී ඉල්ලුමේ සඳහන් කාලය තුළ ආපසු ගෙවන ලෙස, ඒවා අයවිය යුතු ඉඩම් කට්ටිකරුවන් හෝ ණය ගැතියන්ගෙන් ඉල්ලා සිටිය යුතුය.

(2) 01 වැනි උපවගන්තිය යටතේ සඳහන් ඉල්ලීම අනුව, නියම කරනු ලැබූ කාලය තුළ, එකී දීමනාකරුට හෝ ණය ගැතියාට, විය යුතු ආකාරයට එකී වියදම් හෝ ගාස්තු ගෙවීම් කිරීමට අපොහොසත් වුවහොත් හෝ, අකපසු කළහොත්, නිවාස කටයුතු පිළිබඳව කොමසාරිස්වරයා එකී වියදම් හෝ ගාස්තු අයකර ගැනීම සඳහා බලයලත් මහේස්ත්‍රාත් උසාවිය වෙත නිසි ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

(3) එකී වියදම් හා ගාස්තු ද, ඊට එකතු වූ පොලී මුදල් ද අයකර ගැනීම සඳහා උසාවිය වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ විට එම උසාවිය මගින් එකී කට්ටිකරු හෝ ණය ගැතියා වෙත පමුණුවනු ලැබුවා වූ දඩුවමක් ලෙසට එකී වියදම හෝ ගාස්තුව අයකර ගත යුතු වන්නේය.

**නියෝග.**

20. (1) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලගැන්වීමේ කාර්යය සඳහාත්, මෙම ප්‍රඥප්තියෙන් නියම කරනු ලැබීමට නියමිත හෝ නියෝග සෑදීමට නියමිත සියලු කරුණු සඳහාත් ඇමතිවරයා විසින් නියෝග සම්පාදනය කරනු ලැබිය හැකිය.

(2) ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබිය හැකි සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන දිනයෙහි හෝ එහි සඳහන් පසු දිනක දී හෝ ඒවා ක්‍රියාත්මක විය යුතුය.

(3) ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබුවායින් පසුව, හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(4) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනුමැතියේ දිනයෙහි සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු නමුදු, ඒ යටතේ කරන ලද යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතුය. ඇමතිවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එය පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

අර්ථ නිරූපණය.

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි –

"තට්ටිකරු" යනුවෙන් ඔහු විසින් ශිෂ්‍ය කරනු ලැබූ තැනැත්තා හෝ උරුමකාරයා ද ඇතුළත් වේ ;

"ණයගැතියා" යනුවෙන් ඔහු විසින් නම් කරනු ලැබූ තැනැත්තා හෝ උරුමක්කාරයා ද ඇතුළත් වේ ;

"නිවාස සංවර්ධන සමිතිය" නියමිත ආකාරයට ලියාපදිංචි කරනු ලැබූ නිවාස සමිතියකි ;

"ඇමතිවරයා" මධ්‍යම පළාත් අමාත්‍ය මණ්ඩලයේ නිවාස විෂය භාර අමාත්‍යවරයා විය යුතුය ;

"නියමිත" යනුවෙන් මෙම ප්‍රඥප්තිය යටතේ සම්පාදික නියෝග මගින් නියමිත වූ යනුවෙන් අදහස් කෙරේ ;

"පළාත් සභා අරමුදල" යනුවෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III වැනි කොටසේ සඳහන් පළාතේ "පළාත් සභා අරමුදල" යනුවෙන් හැඳින්වේ ;

"පළාත" ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතය ;

"පළාත් සභාව" මධ්‍යම පළාතේ පළාත් සභාව යනුවෙන් අදහස් කෙරේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

22. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ පාඨ අර්ථ කථනය කිරීමේදී අනනුකූල තත්වයක් හෝ ව්‍යාකූල තත්ත්වයක් ඇති විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.